(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 93.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 සැප්තැම්බර් 07 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

43/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ උප පොලිස් පරීක්ෂක තනතුරේ දැනට සිටින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) බඳවා ගැනීම් පටිපාටියට අනුව උප පොලිස් පරීක්ෂක තනතුරේ සිටින නිලධාරියකුට, පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය කොපමණද;

(iii) ඒ අනුව, නියමිත සේවා කාල සීමාව සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂක වරුන්ට උසස්වීම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

310/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එම එක් එක් සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සාමාජිකයාට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් පත් කිරීමේදී විද්වත් කමිටුවේ නිර්දේශ ලබා ගත්තේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

322/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ක්‍රිකට් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා වන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

488/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩා පාසල්වල නම් කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩා පාසලේ මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට ලබා දෙනු ලබන දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(v) ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

599/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වූ ඩෙල්ෆ් දූපතේ පවතින රජයේ පාසල් අටක්, භෞතික සම්පත් සහ සේවක ඌනතාවයන් සහිතව ක්‍රියාත්මක වන බවත්;

(ii) ගොඩබිම් මාර්ගයක් නොමැති වීම හේතුවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීමේදී එම දූපතේ ජීවත් වන සිසුන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ පිහිටි එක් පාසලක හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා ගණිත හා විද්‍යා විෂය ධාරාවෙන් පෙනීසිටීමට ගණිත හා විද්‍යා අංශ ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සඳහන් පාසල්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට අදාළව ගණිත හා විද්‍යා විෂයයන්ගෙන් හැදෑරීම සඳහා අදාළ ගණිත හා විද්‍යා අංශ ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

6.

725/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මී උණ රෝගය වැළඳීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුද්ගලයන් මිය යන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මී උණ රෝගය වැළඳීම හේතුවෙන් 2019 හා 2020 වර්ෂවලදී මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝගය පැතිරීම වළක්වා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

858/2020

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේදී, දේශපාලන හිතවත්කම් මත සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අවභාවිතා කිරීම හා සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා දේශපාලන පදනමින් පත්වීම් ලබාදීම නීත්‍යානුකූල නොවන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් එවකට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒ සම්බන්ධයෙන් වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.12 සිට 2015.06.26 කාලය තුළ සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කළ අමාත්‍යවරයාගේ කාලයේදී රුපියල් ලක්ෂයේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය මුදල;

(ii) එසේ ලබා දුන් ණයවලින් මේ වනවිට අය වී ඇති මුදල;

(iii) තවදුරටත් අයවීමට ඉතිරිව තිබෙන මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එවකට පැවති රජය දේශපාලන පදනමින් තෝරා ගත් පිරිසක් සඳහා මෙම ණය ලබා දුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ සාවද්‍ය ආකාරයෙන් ණය ලබා දීම පිළිබඳව ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

860/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති මුළු සුරාබදු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ සිටින මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුරාබදු දෙපාර්තමේන්තුවේ රජකාරි කටයුතු සඳහා එම නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

873/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැරිය හැකි වන්නේද;

(iv) එම පර්යන්තය ඉදිකිරීමට ගත වන කාලය කොපමණද;

(v) එය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික ආදායම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

944/2020

ගරු මයන්ත දිසානායක මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2019 දක්වා මහනුවර, පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟවලින් උපයාගෙන ඇති ආදායම එක් එක් තරගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2010 සිට 2019 දක්වා ඉහත ක්‍රීඩාංගණය නඩත්තු කිරීම සඳහා වෙන් කළ මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් සිදු කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 සැප්තැම්බර් 21 අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2021 අගෝස්තු 30 දිනැති අංක 2243/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 05 දිනැති අංක 2222/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඛනිජතෙල් සම්පත් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 07/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 1),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 22 දිනැති අංක 2216/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 2),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 09 දිනැති අංක 2218/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 3),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 19 දිනැති අංක 2219/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 4),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 19 දිනැති අංක 2224/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 5),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 13 දිනැති අංක 2223/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 26 දිනැති අංක 2225/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 27 දිනැති අංක 2225/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 27 දිනැති අංක 2225/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 17 දිනැති අංක 2228/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූනි 14 දිනැති අංක 2232/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූනි 30 දිනැති අංක 2234/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

.

*24.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූනි 30 දිනැති අංක 2234/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 3),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූලි 06 දිනැති අංක 2235/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූලි 02 දිනැති අංක 2234/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*30.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

31.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

දූම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1902/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1903/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1907/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) ඒ අතරින් මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iii) මහඔය ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තරය, දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පැවති කාලය;

(iv) එම දෙපාර්තමේන්තුව විසින් ඉහත වනාන්තරය පාලනය කිරීම අත්හරින ලද දිනය සහ ඊට හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දෙපාර්තමේන්තුව විසින් ගල්වලයාය ප්‍රදේශයේ සිදු කර ඇති එක් එක් වන වගා ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වගා කරන ලද වනාන්තර මැන මායිම් ගල් යොදා තිබේද;

(iii) එසේ නම්, මායිම් ගල් යෙදූ වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තර ඉඩම් අතරින් රජයේ රක්ෂිත ලෙස ගැසට් කිරීමට සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) එම ඉඩම් ගැසට් කරනු ලබන දිනය;

(iii) එම ගැසට් කිරීම ප්‍රමාද වීමට හේතු;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2110/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2111/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2112/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2113/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2114/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව වවුනියා දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2115/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2116/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව යාපනය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2490/2021

ගරු කේ.සුජිත් සංජය පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට ප්‍රදේශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාගස්තැන්න වත්ත නමින් වත්තක් තිබෙන බවත්;

(ii) එම වත්තෙන් අක්කර 1000කට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට විකිණීමට හෝ බදු දීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) යටියන්තොට ප්‍රදේශයේ ජනතාවට සම්පතක් වන ඉහත සඳහන් වත්ත, ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේම තබා ගෙන සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---